සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## 11 ශ්‍රේණිය - අනාවරණ පරීක්ෂණය 2020

### ගෘහ ආර්ථික විද්‍යාව - I

**නම/අංකය : ..............................................................** **කාලය : පැය 01යි.**

**උපදෙස් - i) සියළුම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.**

**ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්ණ වලට දී ඇති 1,2,3,4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.**

01. ධාන්‍ය ගණයට අයත් ආහාරයකි.

1. කොස් 2. කුරක්කන් 3. උඳු 4. කවුපි

02. වැඩිහිටියන්ට සිරුර තුළ නිපදවා ගත හැකි අත්‍යාවශ්‍ය ඇමයිනෝ අම්ලයකි.

1. ලයිසීන් 2. හිස්ටඩීන් 3. ආර්ජිනීන් 4. වැලීන්

03. දෛනිකව මිලි ග්‍රෑම්100ට වඩා අඩුවෙන් අවශ්‍ය වන ඛණිජ ලවණයකි.

1. යකඩ 2. කැල්සියම් 3. සෝඩියම් 4. පොටෑසියම්

04. දූරියන් ගෙඩියේ සුවඳ හා රසය අනුව එහි ගුණාත්මක බව තීරණය කරන ලක්ෂණය වන්නේ

1. වයනය 2. පෝෂණය අගය 3. සුවඳ 4. සගන්ධය

05. යම් ද්‍රව්‍යයක් වාතයේ ඇති ඔක්සිජන් සමග ප්‍රතික්‍රියා කිරීම නිසා සිදුවන විපර්යාසය හඳුන්වන්නේ කෙසේද ?

1. ඔක්සිහරණය 2. ඔක්සිකරණය
3. ස්වයං වියෝජනය 4. ප්‍රතිඔක්සිකරණය

06. අත් ගැසීමේදී පිටි මිශ්‍රණයට වාතය ඇතුළු වීම තුලින් , එක් කරන ලද ඊස්ට් හොඳින් ක්‍රියාත්මක වී ......................................................... වායුව මුදා හැරීමෙන් පිටි මිශ්‍රණය පිපීම සිදු වේ.

1. කාබන්ඩයොක්සයිඩ් 2. ඔක්සිජන්
3. ඔක්සයිඩ් 4. නයිට්‍රජන්

07. වැඩි සාන්ද්‍රණයකින් යුත් මාධ්‍යයක සිට අඩු සාන්ද්‍රණ මාධ්‍යයකට ද්‍රව්‍ය අංශු ගමන් කිරීම හඳුන්වන්නේ,

1. විකිරණය ලෙස ය. 2. විසරණය ලෙස ය.
3. ආස්‍රැතිය ලෙස ය. 4. බාහිර ආස්‍රැතිය ලෙස ය.

08. අපරදිග සංස්කෘතියට අනුව ආහාර පිළිගැන්වීමේ ක්‍රම අතර ශ්‍රී ලංකාව තුළ අමුත්තන්ට සංග්‍රහ කිරිමට භාවිතා කරන පිළිගැන්වීමේ ක්‍රමවේදයට ඉතාම සමාන ක්‍රමවේදය වනුයේ,

1. ඇමරිකන් ක්‍රමවේදය
2. ප්‍රංශ ක්‍රමවේදය
3. ජර්මන් ක්‍රමවේදය
4. රුසියානු ක්‍රමවේදය

09. කිරිවල වර්ධනය වන බැක්ටීරියාවක් නොවන්නේ මින් කුමක්ද?

1. ස්ට්‍රෙප්ටොකොකස්
2. ලැක්ටොබැසිලස්
3. මයික්‍රොබැක්ටීරියම්
4. පෙනිසිලියම්

10. පෙලග්‍රා රෝගය ඇති වන්නේ කුමන පෝෂ්‍ය පදාර්ථය ඌණ වීමෙන්ද ?

1. විටමින් $B_3$
2. විටමින් $B_1$
3. විටමින් $B_6$
4. විටමින් $B_9$

11. මිනිස් සිරුර තුළ ප්‍රෝටීන් ජීර්ණය ආරම්භ වන්නේ කුමන අවයවය තුළදිද ?

1. මුඛයේ දි ය
2. ග්‍රහණියේ දීය
3. ආමාශයේදීය.
4. ක්ෂුද්‍රාන්තයේ දීය.

12. අග්න්‍යාශයික යුෂයේ අඩංගු අක්‍රීය ට්‍රිප්සිනෝජන් ක්‍රියාකාරී ට්‍රිප්සීන් බවට පත්වීමට අවශ්‍ය වන එන්සයිමය වනුයේ ?

1. පෙප්සින්
2. ඇමයිනොපෙප්ටයිඩේස්
3. හයිඩ්‍රොක්ලෝරික් අම්ලය
4. එන්ටරෝකයිනේස්

13. විශේෂ පෝෂණ අවශ්‍යතා ඇති අවධියක් නොවන්නේ මින් කුමක්ද ?

1. ළදරු අවධිය
2. මුල් ළමා අවධිය
3. වැඩිහිටි අවධිය
4. යෞවන අවධිය

14. ආහාර තෝරා ගැනිමේදි මතුවන දුෂ්කරතා කිහිපයක් පහත දැක්වේ.

- ගුණාත්මක ආහාර මිලදි ගැනිමට අදායම ප්‍රමාණවත් නොවිම.
- ගුණාත්මක බවින් වැඩි ආහාර අධික මිලකින් යුක්ත වීම.
- නිෂ්පාදකයින්ගේ හා අලෙවිකරුවන්ගේ අනිසි උපක්‍රම හේතුවෙන් ආහාර වල මිල වැඩි විම

මෙම දුෂ්කරතා අදාල වනුයේ,

1. අලෙවිකරුවන්ගේ නොසැලකිලිමත් බවට අදාළවය.
2. ආර්ථික දුෂ්කරතා වලට අදාළවය.
3. ප්‍රමිතියෙන් තොරආහාර බහුල විමට අදාළවය
4. පාරිභෝකයන්ගේ දැනුමවත් නොවිමට අදාළවය

15. ජාතික උත්සවයක් වන්නේ?

1. නබිනායක උපන් දින උත්සවය
2. තෛයිපෝංගල් උත්සවය
3. විවාහ උත්සවය
4. මහ සිකුරාදා දින උත්සවය

16. ආහාර පිළිගැන්විමේදීඑක් පුද්ගලයකු සඳහා වෙන් කළ යුතු ඉඩ ප්‍රමාණය වන්නේ?

1. 10” x 12”
2. 18” x 26 ”
3. 18” x 22 ”
4. 10 ” x 22”

17. ආහාර පරිරක්ෂණයේදි ආහාරය වියළිමට පෙර “ බ්ලාන්ච් ” කිරිමෙන්

1. ආහාර ජීර්ණය පහසු වේ.
2. ඉක්මනින් වියළා ගැනිමට හැකි වේ.
3. ආහාර වල පැහැය වෙනස් වේ.
4. ආහාරවල එන්සයිම අක්‍රිය වේ.

18. ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව යොවුන් විය ලෙස සලකන වයස් කාණ්ඩය වන්නේ,

1. අවුරුදු 15- 18 ය.
2. අවුරුදු 10- 19 ය.
3. අවුරුදු 10-24 ය.
4. අවුරුදු 14-16 ය.

19. ප්‍රාථමික ලිංගික ලක්ෂණයක් ලෙස සැලකෙන්නේ

1. උස වැඩි විමය.
2. බර වැඩි විමය.
3. සිරුරේ හැඩය වෙනස් වීමය
4. ඩිම්බ කෝෂ හා ගර්භාෂ වර්ධනය වීමය.

20. නව යොවුන් වියේදි කායික වර්ධනය හා සම්බන්ධ නොවන ප්‍රකාශය වනුයේ,

1. කැපි පෙනිමට උත්සාහ කිරිම
2. අත්පා කඳට වඩා වේගයෙන්වර්ධනය වීම
3. ළමා ස්වරූපය ක්‍රමයෙන් වෙනස් වි වැඩිහිටියෙක් විම
4. අස්ථි ඝණත්වය වැඩි විම

21. ගර්භනි අවධියේදි ඇතිවිය හැකි සුළු ආබාධයක් නොවන්නේ

1. වමනය
2. ඇදුම
3. පාද ඉදිමිම
4. ආහාර අරුචිය

22. පූර්ව ප්‍රසව සංවර්ධන කාලය තුළ ඩිම්බ අවධිය ගත කරන කාලය වනුයේ

1. සංසේචනයේ සිට උපත තෙක් කාලයයි.
2. සංසේචනයේ සිට දින 14 දක්වා කාලයයි.
3. ඩිම්බ අවස්ථාවේ සිට සති දෙකක කාලයයි.
4. ඩිම්බ මෝචනයේ සිට සංසේචනය දක්වා කාලයයි.

23. සංසේචිත ඩිම්බයක් අධිරෝපණය වන්නේ ස්ත්‍රී ප්‍රජනක පද්ධතියේ කුමන කොටසේ දි ද?

1. යෝනි මාර්ගය තුළදිය
2. ඩිම්බ කෝෂ තුළදිය
3. එන්ඩොමෙට්‍රියම තුළදිය.
4. පැලෝපීය නාලය තුළදි ය.

24. ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග හඳුනාගත හැකි පරීක්ෂණයක් වන්නේ
   1. මුත්‍රා පරීක්ෂණය මඟිනි.
   2. VDRL පරීක්ෂණය මඟිනි.
   3. රුධිර ගණය පිළිබඳ පරීක්ෂණය මඟිනි.
   4. රුධිර පරිමාව මඟිනි.

25. ගර්භනී මවකගේ පටක වර්ධනයට හා කලලයේ පටක වර්ධනයට වැඩිපුර ලබා දිය යුතු පෝෂකය වන්නේ

   1. ප්‍රෝටීන්ය
   2. කාබෝහයිඩේට්ය
   3. අයඩින්
   4. විටමින් A

26. මධ්‍යස්ථ වැඩහි නිරතවන සාමාන්‍ය කාන්තාවකට දෛනික පෝෂණ අවශ්‍යතාවයට අනුව ලබාගත යුතු ශක්ති ප්‍රමාණය වන්නේ

   1. කිලෝකැලරි 3100 ක්ය.
   2. කිලෝකැලරි 2000 ක්ය.
   3. කිලෝකැලරි 2350 ක්ය.
   4. කිලෝකැලරි 3250 ක්ය.

27. ශුක්‍රාණු නිපදවීම හා ශුක්‍රාණු ගබඩා කිරීම සිදු කරනු ලබන්නේ

   1. වෘෂණ කෝෂ තුළය.
   2. ශුක්‍ර ප්‍රණාලය තුළදිය.
   3. වෘෂණ තුළදිය.
   4. ශිෂ්ණය තුළය.

28. උපාංග නිර්මාණය කිරීමේදි යොදා ගනු ලබන ද්‍රව්‍ය ඇතුළත් කාණ්ඩයකි.

   1. රේන්ද , බොත්තම් , විසිතුරු පබළු , දුඹුරු කඩදාසි
   2. ගම් , රිබන් , මිනුම් පටිය , ඉදිකටු
   3. සන්නාලි හුණු කූරු , කෝඩ්, දැති රෝදය , පැන්සල
   4. දැති රෝදය , රේන්ද , ඝන කඩදාසි , දිදාලය

29. විසිතුරු මැහුම් ක්‍රමයක් ලෙසත් , වාටියක් නිම කිරීම සඳහාත් , බික්කු මැසිමේදිත් යොදා ගත හැකි මැහුම් ක්‍රමයකි.

   1. ලේසි ඩේසි මැස්ම ය.
   2. කතිර මැස්ම ය.
   3. බ්ලැන්කට් මැස්ම ය.
   4. නැටි මැස්ම ය.

30. ළදරු ඇඳුමක් මැසීමට පතරොම සකස් කර ගැනීමේදි දුඹුරු කඩදාසිය සකස් කර ගත යුතු ප්‍රමාණය වන්නේ,

   1. දිග 45 cm x පලල 30 cm කි.
   2. දිග 25 cm x පලල 52cm කි.
   3. දිග 52 cm x පලල 25cm කි.
   4. දිග 52 cm x පලල 52cm කි.

31. සම්මත මිනුම යනු,
   1. වයස් මට්ටම් කීහිපයක ගන්නා ලද මිනුම් වල සාමාන්‍ය අගයකි.
   2. එකම වයස් සීමාවක පසුවන පුද්ගල නියදියක සාමාන්‍ය අගයකි.
   3. ඉන , උරහිස මිනුම් සමානව ගෙන පතරොමක් නිර්මාණය කිරීමට ගන්නා අගයකි.
   4. ගැහැණු පිරිමි භේදයකින් තොරව මිමි ගෙන ඇඳුම් නිර්මාණය කිරීමකි.

32. ප්‍රංශ ගැට මැස්ම මසනු ලබන්නේ,

1. ඉදි කටුව වටා නූල් පටවල් 10 ක් පමණ පටලවා මතුකර ගැනිම.
2. ඉදි කටුව වටා නූල් පටවල් 02 ක් පමණ පටලවා මතුකර ගැනිම.
3. ඉදි කටුව වැසෙන සේ නූල් පටවල් ඔතා මතුකර ගැනිම.
4. ඉදි කටුව යටට ගසා නැවත මතුකර ගැනිම.

33. විකර්ණාකාර පටි කපා ගැනිම සඳහා වඩාත් සුදුසු රෙදි කැබැල්ලක හැඩය වන්නේ,

1. 
2. 
3. 
4. 

34. ළමා ගවුමක් මැසීමේදි ඉදිරි පසට විසිතුරු කරන ලද පෝරුවක් යොදන්නේ නම් එය සකස් කර ගත යුත්තේ,

1. ඇඳුම මසා අවසන් කළ පසුවය
2. කඳ කොටස පිටුපස කොටසට තබා මැසීමෙන් පසුවය.
3. කඳ කොටස මසා අවසන් කල පසුවය.
4. ඇඳුමේ කඳ කොටස සම්බන්ධ කිරිමට පෙර එය මැසිම කල යුතුය.

35. ළදරු ඇඳුමක් මැසිම සඳහා වඩාත් සුදුසු රෙදි වර්ග ඇතුලත් කාණ්ඩය වනුයේ,

1 ටෙරලින් , වොයිල් , මල් රෙදිය
2. ලිනන් . ලෝම , ටෙරලින් ය.
3. නෙන්සුක් , ලෝන් , වොයිල් , මල් රෙදිය .
4. නයිලෝන් , ලෝන් , වොයිල් ය.

36. පවුලක පුද්ගල සම්බන්ධතාව පවුලේ සුභදතාවයට බෙහෙවින් ඉවහල් වේ. මේ අදහස ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින්ද ?

1. ජී.පි. මර්ඩොක්
2. කැතලින් ගෆ් විද්‍යාඥවරිය
3. විවිධ සමාජ හා මානව විද්‍යාඥයින්
4. හොක් හා පැවොලුසි

37. ස්වාභාවික ආලෝකය හා වාතාශ්‍රය ලැබිම මත සුවපහසුව හා සෞඛ්‍යාරක්ෂිත බව රඳා පවති. කාමරයකට වාතය ඇතුළු වි සාමාන්තරව පිටවී යාම හඳුන්වන්නේ?

1. සංවාතනයයි.
2. හරස් සංවාතනයයි.
3. සංවහනයයි.
4. හරස් සංවහනයයි.

38. වර්ණ චක්‍රයේ ඇති කොළ හා තැඹිලි වර්ණ දෙක සම ප්‍රමාණයෙන් මිශ්‍ර කිරිමෙන් සාදා ගත හැකි තෘතීයික වර්ණය වන්නේ ,

1. තෘතීය රතු
2. තෘතීය කහ
3. තෘතීය නිල්
4. තෘතීය කොළ

39. මෝස්තර මූලධර්මයක් හා කලා මූලිකාංගයක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ.

1. රේඛා හා හැඩය
2. තුලනය හා රිද්මය
3. එකඟත්වය හා වයනය
4. වර්ණය හා තුලනය

40. පවුලකට ලැබෙන ආදායම් හා වියදම් තුලනය කරමින් මුදල් පරිහරණය කිරිම ඥානාන්විතව කල යුත්තකි.මෙහි ආදායම් මාර්ගයක් වන මූර්ත ආදායම සඳහා උදාහරණයක් වන්නේ,

1. වැටුප්
2. භාණ්ඩ හා සේවා
3. පොළි
4. බදු

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## 11 ශ්‍රේණිය - අනාවරණ පරීක්ෂණය 2020

### ගෘහ ආර්ථික විද්‍යාව II

නම/අංකය : .................................................................. කාලය : පැය 02 යි.

උපදෙස් :- ප්‍රශ්ණ 05 කට පමණක් පිළිතුරු සපයන්න.

01.) පෙර පාසල් වියේ පසුවන දියනියක් සිටින සකුන්තලා ගර්භනි මවකි. සැමියා ලිපිකරුවෙකු ලෙස සේවය කරයි. තම සැමියාගෙන් නිවසේ කටයුතුවලට ලැබෙන සහාය නිසා ඉතා සතුටින් හා ප්‍රබෝධයෙන් කල් ගෙවන්නීය. සෑම සෙනසුරාදා දිනකම උදේ ආහාරය සඳහා ආප්ප පිළියෙළ කරයි. මැහුම් නිර්මාණ පිළිබඳ විශේෂ කුසලතා ඇති, අවුරුදු 70 ක් වයසැති මවද ඔවුන් සමග ජීවත් වේ.

i. ගර්භනි මවක් වන සකුන්තලාගේ විශේෂ පෝෂණ අවශ්‍යතා දෙකක් සඳහන් කරන්න.

ii. රැකියාවට යන සැමියාට රැගෙන යාම සඳහා දිවා ආහාර වේලක් සැකසීමේදී අවධානය යොමු කල යුතු කරුණු 02 ක් ලියන්න.

iii. පෙර පාසලට යන දියණියට උදේ 10.00 ට ගැනිමට සුදුසු බොජුන් පතක් ලියන්න.

iv. සෙනසුරාදා උදේ ආහාරය සඳහා ආප්ප පිසීමේ ක්‍රමය හා තාප සංක්‍රාමණ ක්‍රමය සඳහන් කරන්න.

v. නිදන කාමරය සඳහා සකුන්තලාගේ මව විසින් නිර්මාණය කරනු ලබන ගෘහ පිළි 04 ක් ලියන්න.

vi. පෙර පාසල් වියේ දියණියට ගවුමක් මැසීම සඳහා පපු මිම්ම 60cm කි. පපු මිම්ම ගණනය කරන ආකාරය ලියා දක්වන්න.( ඉදිරිපස පපු මිම්ම සඳහා )

vii. ගර්භනීභාවයේ ලක්ෂණ 04 ක් ලියන්න.

viii. ස්ත්‍රී ප්‍රජනක පද්ධතිය තුල ඩිම්බයක් හා ශුක්‍රාණුවක් සංසේචනය වීමත් සමග සෛල බෙදීම ආරම්භ වේ.මෙම අවස්ථාව පූර්ව ප්‍රසව සංවර්ධනයේ කුමන අවධියට අයත් වේද?

ix. සකුන්තලාගේ මෙම පවුල අයත් වන්නේ කුමන පවුල් වර්ගයටද ?

x. මෙම පවුල තුල දැකිය හැකි ලක්ෂණ 02 ක් ලියන්න. (ලකුණු 02 x 10 = 20)

02) i) මූලික මැහුම් ක්‍රම 03 ක් හා විසිතුරු මැහුම් ක්‍රම 03 ක් නම් කරන්න. (ලකුණු 03)

ii) ළදරු ඇඳුමක තිබිය යුතු විශේෂ ලක්ෂණ 03 ක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii) ළදරු ඇඳුමක් සඳහා සුදුසු ඇඳුම් පන්නයක් අඳින්න. එය විසිතුරු කිරීමට යොදා ගන්නා මෝස්තරයක් ඇඳ එය මැසීමට යොදා ගත් මැහුම් ක්‍රමයක් ඇඳ දක්වන්න. (ලකුණු 04)

03) i) පහත සඳහන් ආහාර ද්‍රව්‍ය අපගේ දෛනික ආහාර වේල් වල ඇතුලත් කිරීම වැදගත් වේ. පහත සඳහන් ආහාර වැදගත් වීමට බලපාන කරුණු එක බැගින් ලියන්න.

a) කුඩා මාළු

b) නිවුඩු සහිත හාල්

c) මුං ඇට (ලකුණු 03)

ii) කාබෝහයිඩ්රේට් පෝෂකයෙන් ඉටුකරන කාර්යයන් 03 ක් විස්තර කරන්න.(ලකුණු 03)

iii) සිරිපාල උදේ ආහාරය සඳහා මඤ්ඤොක්කා සමග පොල් අනුභව කරන ලදි. මෙම ආහාරවල අඩංගු ප්‍රධාන පෝෂක දෙකහි ජීර්ණ ක්‍රියාවලිය සමීකරණ මගින් වෙන් වෙන්ව ලියා දක්වන්න. (ලකුණු 04)

04) i) මහළු අවධියේ පසුවන අයෙකු සඳහා රාත්‍රී ආහාරයට සුදුසු බොජුන් පතක් ලියා දක්වන්න.

(ලකුණු 03)

ii) ඉහත බොජුන් පතේ එක් එක් ආහාරය තෝරා ගැනීමට හේතුව පැහැදිලි කරන්න.

(ලකුණු 03)

iii) ඔබගේ ගෙවත්තෙන් ලබා ගත හැකි ආහාර ද්‍රව්‍යයක් පරිරක්ෂණය කරන අයුරු පියවරෙන් පියවර සඳහන් කරන්න. (ලකුණු 04)

05) i) පහත සඳහන් නිර්ණායක සැලකිල්ලට ගනිමින් ආලින්දය සඳහා දී ඇති පරිමාණයට අනුව බිම් සැලැස්මක් අඳින්න.

( පරිමාණය ⟶ අඩි 1 = 1 cm)

- කාමරයේ ප්‍රමාණය - 9′ x 7′
- අඩි 09 බිත්තියේ ප්‍රධාන දොර පිහිටා ඇති අතර (එය දෙපියන් දොරකි)
- අඩි 7 බිත්තිවල පියන් දෙකේ ජනේල පිහිටා ඇත.

(ලකුණු 03)

ii) ඒක වර්ණ ගැලපුමක් යන්න පැහැදිලි කර අවුරුදු 10 ක පිරිමි ළමයෙකු උදෙසා ළමා කාමරයකට ඒක වර්ණ ගැලපුමක් යොදා ගන්නා අයුරු උදාහරණ දෙමින් ඉදිරිපත් කරන්න. (ලකුණු 03)

iii) ළමා කාමරය ප්‍රසන්න ලෙස අලංකරණය වී ඇත". මේ ප්‍රකාශය කරුණු 03 ක් ඔස්සේ සනාථ කරන්න. (ලකුණු 04)

06) i) ස්ත්‍රී ප්‍රජනක පද්ධතියට අයත් කොටස් 06 ක් නම් කරන්න. (ලකුණු 03)

ii) ගර්භනි කාලය තුළ ප්‍රමාණවත් ලෙස අයඩීන් ආහාරයට ඇතුලත් කර නොගැනිම නිසා ඇතිවන තත්ත්වයන් 03 ක් ලියන්න. (ලකුණු 03)

iii) නිරෝගී දරු උපතක් සඳහා ගර්භනී මවක් මාතෘ සායනයට සහභාගි වීම අත්‍යාවශ්‍ය වේ. මාතෘ සායනයකින් ගර්භනී මවකට ඉටුවන කාර්යයන් 04 ක් දක්වන්න (ලකුණු 04)

07) i) ගර්භනි අවධියේදී යකඩ අවශ්‍යතාවය වැඩි වීමට බලපාන හේතු තුනක් නම් කරන්න.

(ලකුණු 03)

ii) නව යෞවන අවධියේදි ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේ ම දක්නට ලැබෙන,

ද්විතීයික ලිංගික ලක්ෂණ 03 බැගින් වෙන් වෙන්ව ලියන්න. (ලකුණු 03)

iii) පහත සඳහන් මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

a) ගර්භනි අවධියේදි බලපෑම් ඇති කළ හැකි අවධානම් සාධක

b) යොවුන් වියේදි දක්නට ලැබෙන මානසික වර්ධනය (ලකුණු 04)